# "ලෝවැඩ සඟරාව" රචනා කිරීමේදී "සද්ධම්මෝපායන" නම් පාලි ග්‍රන්ථ කතුවරයාගේ අභිප්‍රාය තීව්‍ර කර දැක්වීමට ගත් ප්‍රයත්නය පිළිබඳව විමසා බැලීමක්.

මහාචාර්ය අලහේනේගම සුමනරතන හිමි

පොදුජන හදවත් තුළට ධර්මය ඇතුළු කිරීම ද ධර්මග්‍රන්ථය කින් අපේක්ෂා කෙරෙයි. මේ හැරුණු කොට ආධුනිකයන්ට විවිධ ගණයේ තොරතුරු අනාවරණය කර ගැනීමටත්, විවිධ උගතුන්ට පර්යේෂණ පැවැත්වීමටත් මෙයින් ඉමහත් පිටිවහලක් ලැබෙයි. සාමාන්‍ය ජන යාට මෙලොව යහපත් සත්සිරිත් වර්ධනය කර ගැනීමට මහත් උපකාර යක්වෙයි. එවන් වටිනාකම්වලින් අනූන, පශ්චාත්කාලීන ලේඛ කයන්ට ආභාසයක් ලබා දුන් මහඟු ග්‍රන්ථයකි, පාලි භාෂාවෙන් රචිත සද්ධම් මෝපායන" නම් වූ කෘතිය.

"සද්ධම්මෝපායන" කතුවරයා වශයෙන් බොහෝ උගත්හු අනු රාධපුර අභයගිරි ආරාමයේ වැඩ විසූ කාව්‍යකරණයෙහි අතිදක්ෂ යෙකු වූ කවි චක්‍රවර්තී ආනන්ද ස්වාමීන් වහන්සේ බව පිළිගනිති.[1] ග්‍රන්ථ රචිත කාලය පිළිබඳව යම් යම් මතභේද ද පවතී. අනුරාධපුර යුගයේ අවසාන භාගය හෝ දඹදෙණි යුගයේ මුල් භාගය හෝ යනු ද ඒ අතර වෙයි. එහෙත් පිළිගත හැකි වැඩි සාධක අනුව පොළොන්නරු යුගයේ අවසාන භාගයේදී පමණ රචනා වෙන්නට ඇතැයි පිළිගැනේ.[2] ග්‍රන්ථය ලිවීමේදී කතුවරයාගේ මූලික ම අදහස වූයේ තමන්ගේ ඉතා හිතවත් වූ බුද්ධසෝම නමැති හිමියන්ට යැවීමට බව තුන්වන ගාථා වෙන් ප්‍රකාශ වෙයි.

"සද්ධම්මෝපායනං කිංචි - රචයිස්සාමි පෙසිතුං
නාමතො බුද්ධ සොමස්ස - පියසබ්‍රහ්මචාරිනො"[3]
(3 ගාථාව)

එමෙන්ම "සද්ධම්මෝපායනය" ආනන්ද හිමියන් විසින් රචනා කරන ලද්දේ බුද්ධසෝම හිමියන් ශ්‍රමණ ජීවිතය අත්හැරීමෙන් වළක්වා ගනු පිණිස බව ගුණපාල මලලසේකර මහතා ස්වකීය ග්‍රන්ථයෙන්

පෙන්වා දෙයි.[4] මෑත කාලීන උගත්හු මෙහි සංස්කරණ කීපයක් ම සිදු කළහ. එම සෑම සංස්කරණයක ම ග්‍රන්ථ ප්‍රමාණය වශයෙන් ගාථා හයසිය විසි එකක් (621) වශයෙන් සඳහන් වෙයි.

**ග්‍රන්ථයෙහි ඇතුළත් කරුණු වශයෙන්**

අක්ඛණ දීපන ගාථා (පින් නොකළ හැකි තැන්)
දස අකුසල පථ ආදීනව ගාථා (දස අකුසල්හි දොස්)
පේත දුක්ඛ වණ්ණනා ගාථා (ප්‍රේත යෝනියේ දුක්)
තිරච්ඡාන දුක්ඛ වණ්ණනා ගාථා (තිරිසන් ගතියේ දුක්)
පාපාදීනව ගාථා (පාපයේ දොස්)
පුඤ්ඤඵලුද්දේස ගාථා (පිනෙහි විපාක)
දානානිසංස ගාථා (දානයේ අනුසස්)
සීලානිසංස ගාථා (සීලයේ අනුසස්)
භාවනානිසංස ගාථා (භාවනාවේ අනුසස්)
පත්තිදානානිසංස ගාථා (පින්දීමේ අනුසස්)
අනුමෝදනානිසංස ගාථා (පින් අනුමෝදනාවේ අනුසස්)
දෙසනානිසංස ගාථා (බණ කීමේ අනුසස්)
පූජානිසංස ගාථා (පූජාවේ අනුසස්)
වෙය්‍යාවච්චානිසංස ගාථා (වතාවතෙහි අනුසස්)
සංපහංසනානිසංස ගාථා (පින්කරුගේ ගුණ වැනීමේ අනුසස්)
සරණානිසංස ගාථා (තෙරුවන් සරණ යෑමේ අනුසස්)
අනුස්සරණානිසංස ගාථා (තෙරුවන් සිහිකිරීමේ අනුසස්)
අප්පමාදානිසංස ගාථා (අප්‍රමාද අනුසස්)

යන කොටස්ද ඊට අමතර වශයෙන් පත්තිදානානුමෝදනා (ගාථා 03 කි.) සහ පත්ථනා ගාථා (ගාථා 05 කි) කීපයක් සඳහන් වෙයි.

සද්ධම්මෝපායනයෙහි ධර්ම කරුණුවල ඇති ස්වභාවය, චිර ප්‍රසිද්ධිය වැනි කරුණු පාඨක චිත්තාරාධනයට අතිශයින් ම ඉවහල් විය. මෙසේ මෙම ග්‍රන්ථය මහාර්ඝ වූ කෘතියක් බවට පත් වූයේ මෙකී ග්‍රන්ථ රචනයට මහෝපකාරී වූ පූර්ව ප්‍රකට කෘතීන්හි ස්වරූපයත්, ග්‍රන්ථ



රචනයෙන් පසුව පශ්චාත් කාලීන කරුණුත් හේතු කොට ගෙනය. කවි චක්‍රවර්තී ආනන්ද හිමියන්ට පාලි සද්ධම්මෝපායනය නිර්මාණය කිරීමේ දී ඊට පූර්වයෙන් ලියැවුණු බෞද්ධ ග්‍රන්ථ කීපයකින්ම හරවත් වූ තොරතුරු සාරය බල පැවැත්වීය. එසේ පූර්වයෙන් බලපෑ ග්‍රන්ථ අතර සංයුක්තනිකාය, අංගුත්තරනිකාය, දීඝනිකාය, ජාතකපාලිය, විසුද්ධිමග්ග, ධම්මපදට්ඨකථා, චුල්ලවග්ග පාලි, මජ්ඣිමනිකාය, විභංගප්පකරණ, පෙතවත්ථුපාලි, ධම්මපදපාලි, ථෙරගාථාපාලි, ඛුද්ධකපාඨ, විමති විනෝදනී ටීකා, හා පටිසම්භිදා මග්ග වැනි ග්‍රන්ථ ප්‍රධාන විය. සද්ධම්මෝපායනයෙන් ආභාසය ලබා ආලෝකවත් වූ ග්‍රන්ථ අතර පාලි රසවාහිනියයි, සද්ධර්මාලංකාරය, ලෝකෝපකාරය, උපාසකජනාලංකාරය, කාව්‍යශේඛරය සහ ලෝවැඩ සඟරාව වැනි කෘතීහු ප්‍රමුඛස්ථානයක් දරති.[5]

සද්ධම්මෝපායනය රචනා කිරීමෙන් ආනන්ද හිමියන් කුමන අභිප්‍රායක් ඇතිකර ගත්තේදැයි මීළගට සොයා බැලිය යුතුය. ග්‍රන්ථ කරණයට හේතුව කුමක්දැයි අපි මීට කලින් සාකච්ඡා කෙළෙමු. හේතුව එසේ පැවතියත්, ග්‍රන්ථයෙහි අන්තර්ගත කරුණු තුළින් ඊට වඩා පෘථුල කාරණයක් අපේක්ෂා කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

සසරෙහි සැරිසරන සත්වයාට මිනිසත් බවක් ලබා ගැනීම අතිශයින්ම දුෂ්කර වූ කාර්යයකි. එසේ දුෂ්කරව හෝ හේතු සම්පත් සහිතව උපදින මිනිසාට පින් කර ගැනීමේ ස්ථාන අවස්ථා බොහෝය. එහෙත් නරකය, තිරිසන්, ප්‍රේත, අරූප, අසංඥ තලය, ප්‍රත්‍යන්ත දේහය, පසිඳුරන්ගේ විකල බව, මිථ්‍යාදෘෂ්ටිය හා අබුද්ධෝත්පාද කාලය යන අවස්ථා අටෙහි සිටින පිරිසට පින්කම් නොකළ හැකි බව කියා පෑමද කතුවරයාගේ ප්‍රමුඛ අපේක්ෂාවකි.

තව ද හිංසා, ථෙය්‍ය, අඤ්ඤදාරානංගමනං, මුසා, පෙසුඤ්ඤ, ඵරුස, සම්ඵචාචා, අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි යන අකුසල්හි ඵල විපාක මිනිසාට පෙන්වා දීම ද අනඳ හිමිපාණන්ගේ තවත් බලාපොරොත්තුවක් විය. ප්‍රේත යෝනියෙහි දුක, අතිශයින්ම කණගාටුදායකය. එය පෙන්වා දීම කතුවරයා තමා සතු වගකීමක් ලෙස සැලකීය.

තිරිසන් ගතියේ එන දුක ද අතිශයින්ම රළුය. කටුකය. ඊට අයත් නරක යෙහි කොටස් දොළස

''අවීචිනරකය, ගූථ නරකය, උණු අළු නරකය, කටුහිඹුල් නරකය, අසි පත්වන නරකය, ඛාරෝදිකා නදී නරකය, අඟුරු පව් නරකය, සංඝාත නරකය, රෞරව නරකය, කාලහත්ථි නරකය, මහා යන්ත්‍ර නරකය, ලොහොකුඹු නරකය''

වශයෙන් පෙන්වා දී තිබීම ද පාඨක ප්‍රියත්වයක් ගෙන්වා දෙයි. පාපයන්ගේ ආදීනව ළඟට දොළොස් පින් කිරියවත් ද කියා පායි. පිනෙහි කොටස් වශයෙන්

දාන, සීල, භාවනා, පින්දීම, පින් අනුමෝදනා වීම, බණ කීම, බණ ඇසීම, පිදිය යුත්තන් පිදීම, වතාවත් කිරීම, ප්‍රශංසා කිරීම, සරණ යාම, සිහි කිරීම යන අංග දොළොස පෙන්වා දෙයි. පිනෙහි විපාක දැක්වීම කතුවරයාගේ හැඟීම වේ.

අනතුරුව දානයෙහි ආනිශංස දැක්වීම, සීලයෙහි ආනිශංස දැක්වීම, භාවනාවේ ආනිශංස දැක්වීම, පින්දීමේ ආනිශංස දැක්වීම, බණ ඇසීමේ ආනිශංස දැක්වීම, පූජාවේ ආනිශංස දැක්වීම වතාවතෙහි ආනිශංස දැක්වීම, ආදිය ඉදිරිපත් කිරීම කතුවරයාගේ අභිලාෂය වී තිබූ බව පෙනෙයි.

"ලෝවැඩසඟරාව" කාව්‍ය සංග්‍රහය ද උගත් නූගත්, ලොකු කුඩා ජනයා අතර ඉතා ජනප්‍රිය ග්‍රන්ථයකි. පාපයට බිය ඇති කරවන කුසලට පොලඹවන බෞද්ධයාගේ අත් පොතකි. වෙනත් දහම් අදහන පුද්ගල යෙකුට වුව ද ජීවිතය සුමගට හරවන හිතවතෙකි. දිවි දියුණුවේ කලණ මිතුරෙකි.

මෙහි කතුවරයාණෝ වීදාගම විහාරයෙහි වැඩ විසූ මහනෙත් පාමුල මෛත්‍රිය මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙති. ඒ බව එහි අවසාන පද්‍යයෙන් කියැවේ.



"වීදාගම වෙහෙරෙහි මෙත් තෙරිඳු ස ද
සාදාරණව පැවැසූ මෙත් සිතින් න ද
බාදා නොවී මොක් දැකුමට බැඳි මෙ ප ද
පාදා සතුන් සිත පවතීවා ති බ ද[6] (140 පද්‍යය)

කෝට්ටේ රාජ්‍ය අවධියේ හවෙනි පැරකුම්බා රාජ්‍යෝදයේ රචනා විය. පුෂ්පබණ්ඩාර සන්නස්ගල මහතා සඳහන් කරන්නේ පැරකුම් රජ කාලයේම ක්‍රි.ව. 1446 වර්ෂයට කලින් නිර්මාණය වූ බවයි.[7] ජනයාගේ ගුණනුවණ දියුණු කොට අකුසලින් මුදවා කුසලින් පෝෂණ කිරීමත්, සියලු සත්වයන්ට නිවන අත්කර දීමත් ග්‍රන්ථය රචනා කිරීමේ අභිමතාර්ථය වූ බවද පෙන්නුම් කරයි. මෙකී ග්‍රන්ථය කියවන්නාටත්, අසන්නාටත්, එසේම ධර්මය දන්නා පිරිසටත්, බණ නොදන්නාටත් ඉමහත් ප්‍රයෝජනයක්ම සලසයි. කෙනෙකුට කුඩා කාලයේ සිටම මෙහි පද්‍ය දෙකතුනක් වනපොත් කර ගත්තේ වුවද තම ජීවිතය බොහෝ යහපත් දේ එක් රැස් කර ගත හැකිය.

"ලෝවැඩසඟරාව" නිර්මාණය කිරීමේදී "සද්ධම්මෝපායනය", ''ධම්මපදය" වැනි ග්‍රන්ථවල ආභාසය ලබා ගෙන තිබේ. එහෙත් එයින් වැඩි බලපෑමක් ලැබී ඇත්තේ සද්ධම්මෝපායනයෙනි. සමහර උගතුන් සඳහන් කරන්නේ ලෝවැඩසඟරාව යනු සද්ධම්මෝපායනයේ අනුවාද යක් ලෙසිනි. එහෙත් පොදු වියතුන්ගේ මතය වන්නේ ලෝවැඩ සඟරාකරු අනිවාර්යයෙන්ම පාලි සද්ධම්මෝපායන ග්‍රන්ථයේ ආභාසය දැඩි ලෙස ලබාගෙන ඇති බවයි.[8]

මෙතැන් සිට සද්ධම්මෝපායන කර්තෘගේ අභිප්‍රාය තීව්‍ර කර දැක්වීමට ලෝවැඩසඟරාකරුවා කුමන ප්‍රයත්නයක් දැරුවේදැයි විමසා බැලිය යුතු වෙයි. අභයගිරි කවි චක්‍රවර්ති ආනන්ද හිමියන් විසින් සද්ධම්මෝපායනය රචනා කිරීමේදී ප්‍රථයෙන් ම බුද්ධ නමස්කාරයෙන් අනතුරුව තෙරුවන් වන්දනාවක් සිදු කරනු ලබයි.

"සබ්බාසව විනිම්මුත්තං - සබ්බසාධුගුණාකරං
සබබලෝකගරුං වීරං - හිතං අමතමග්ගදං'' (1 ගාථාව)

"සබ්බාදරෙන වන්දිත්වා - සම්මා සම්බුද්ධමාදිතො
අථ ධම්මඤ්ච සංඝඤ්ච - සද්ධාය මුද්ධනා අහං"[9] (2 ගාථාව)

මම සියලු ආශ්‍රවයන්ගෙන් මිදුණු සියලු යහපත් ගුණයන්ට උත්පත්තිස්ථානය වූ වීර වූ ද, හිත වූ ද, නිවන් මග දෙන්නා වූ ද, මුළු ලොවට ගුරු වූ

සම්මා සම්බුදුන් පළමු කොට සියලු ආදරයෙන් හා සද්ධාවෙන් යුතුව මුදුනෙන් වැඳ අනතුරුව ධර්මය ද සංඝයා ද නැමද,

යනුවෙන් උන් වහන්සේ තෙරුවන් වන්දනාවට වැය කොට ඇත්තේ ගාථාද්වයක් පමණි. බුදුරජාණන් වහන්සේගේ ගුණ ඉතා සංක්ෂිප්තව වර්ණනා කරන අතර ධර්ම රත්නය හා සංඝරත්නය නාමිකව වන්දනා කරති.

"ලෝවැඩසඟරා වර්ණනාව" නම් වූ කාව්‍යයෙහි කර්තෘ කවිචක්‍ර චූඩාමණී වීදාගම මෛත්‍රී මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ද නමස්කාර යෙන් පද්‍ය කෘතිය ආරම්භ කොට තෙරුවන් වන්දනා කරති. බුද්ධ රත්නය වන්දනාවට වෙන්කර ඇත්තේ එක් පද්‍යයක් වුවද එයින් හැඟෙන අර්ථය අසන්නාට කර්ණ රසායනයක්ය. ඕනෑම තරාතිරමක පුද්ගලයෙකුට වුවද සැනසුම ගෙන දෙන්නකි. බස සරලය, සුගමය. අතීත ආගමික විස්තරයක් පෙන්නුම් කරයි.

"සෙත් සිරි දෙන මහ ගුණ මුහුදාණන්
සත් හට වන බව දුකට වෙදාණන්
තිත් ගනඳුර දුරලන දිනිදාණන්
සිත් සතොසින් නමදිම් මුනිදාණන්"[10] (පද්‍ය 1)

ශාන්ත ශ්‍රීය ගෙන දෙන මහත් වූ ගුණයට මහ මුහුදක් වැනි වූ සත්වයාට සිදු වෙන්නාවූ භවයහි පවත්නා දුකට වෛද්‍යවරයෙකු වැනි වූ තීර්ථක නමැති සනාන්දකාරය දුරු කිරීමෙහි ලා සූර්යා වැනි වූ මුනීන්ද්‍රයන් වහන්සේ සිත සන්තෝෂයෙන් නමස්කාර කරමි.



"සෙත්සිරි" යන පදය කියවන අසන විට පාඨකයාට හා අසන්නාට ලොව්තුරු වූ නිර්වාණ සම්පත්තිය පිළිබඳව කිසියම් හැඟීමක්, ප්‍රසාදයක් ඇතිවෙයි. නිවන් පිළිබඳව ගැඹුරක් හා පෙලඹ වීමක් ඇතිවෙයි. බුද්ධගුණය කොතරම් ගම්භීර ද, කොතරම් දිග ද, පළල ද කියා පෙන්වා දෙන්නේ ලෝකයට සාරභාර වස්තුවක් වූ මහ මුහුද උපමා කර ගනිමිනි. ලොව වැඩිදෙනෙක් ප්‍රඥාවෙන් විනිර් මුක්තය. මිථ්‍යාදෘෂ්ටිය නැමැති ගන අඳුරෙහි නිමග්නව වාසය කරති. එම ගන අඳුර ලොවින් පලවා හැරීමට සිටින එකම ජගතා හෙවත් සූර්යයා වන්නේ බුදුරජාණන් වහන්සේය. එවන් අපරිමිත කරුණා මෛත්‍රී ගුණ ඇති භාග්‍යවතුන් වහන්සේ අනන්ත සසර දුකෙහි ගිලී සිටින්නා වූ සත්ත්වයන් එම දුකෙන් මුදවා ගන්නා හෙයින් කතුවරයා සැදැහැයෙන් හා අතිශය ගෞරවයෙන් බුදුරදුන් නමදියි.

දෙවන ගාථාවේ අන්තිම කොටසේ තුන්වන පාදයේ "අථ ධම්මඤ්ච සංඝඤ්ච" යනුවෙන් ඉතාමත් කෙටියෙන් සද්ධම්මෝපායන කරුවා දහම් සඟුන් සිහිපත් කරයි. ලෝවැඩසඟරාවේ එසේ පාදයකට පමණක් සීමා නොකොට එක් එක් පද්‍යය බැගින් වෙන් කොට ඇති ආකාරයත්, බොදු බැතිය වැඩි වැඩියෙන් ඇති කරවීමටත් සමත්කම් දක්වන ආකාරයත් පෙන්නුම් කෙරෙයි.

ඇම පමණනින් පැවසූ මුනි දැන තතු
මෙම හැම දෙන බලවයි දැක් විය යුතු
තම තම නැණ පමණින් දැන ගත යුතු
මම නම දිම් සදහම් පහදා සිතු[11] (2 පද්‍යය)

මුනීන්ද්‍රයන් වහන්සේ විසින් ලෝකයේ පවත්නා ස්වභාවය මැනවින් දැනගෙන සියලු දෙනාගේ නුවණෙහි ප්‍රමාණ වශයෙන් දැන ගෙන දේශනා කරනු ලැබුවා වූ සැම දෙනාම මෙය බලවයි දැක්වීමට යෝග්‍ය වූ ද, එසේම තම තමන්ගේ ඥානයේ පමණට දැන ගත යුතු වූ ද ශ්‍රී සද්ධර්මය සිත පහදා ගෙන වන්දනා කරමි.

"ඇම පමණින් පැවසූ මුනි දැන තතු" යන පදයෙන් ත්‍රිපිටක ධර්මයත් නව ලෝකෝත්තර (සතර මග, සතර ඵල හා නිවන) ධර්මයත්

පෙන්නුම් කරයි. හෙවත් ඒ ඒ පුද්ගලයාට සැප ගෙන දෙන ආකාරයට බුදුරදුන් ධර්මය විසිතුරු කොට දෙසූ බව සඳහන් කරයි.

"මෙම හැම දෙන බලවයි දැක් විය යුතු" යන පද්‍ය පාදයෙන් සියලු දෙනා මෙහි අවුත් බලව් (එහි පස්සිකො) යන්නෙන් සත්‍යවූත්, පිරිසිදු වූත්, රහසක් නැතිවූත්, බුද්ධ ධර්මයෙහි අගය වටහා ගත යුතු බව අවධාරණය කරයි. "තම තම නැණ පමණින් දැන ගත යුතු" යන කොටසින් ඥානවන්තයන් විසින් තමන්ගේ ඥානයේ ප්‍රමාණයෙන් ධර්මය දැනගැනීම (පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි) සුදුසු බවට පාඨකයා සහ අසන්නා පොලොඹවයි. එවන් උත්තම ධර්මයක් කෙරෙහි පවත්නා විශ්වාසයෙහි තරම ඉදිරිපත් කරන ආකාරය සැබැවින් ම සිත් ගන්නා සුලුය.

"සිරිමත් බඹ සිරසෙහි පා පිසි නා
සැරියුත් මහ මුගලන් පිළිවෙළි නා
පිළිවෙත් සරු මහ සඟගණ සෙබා නා
මුදුනත් බැඳ නමදිම් බැති පෙම් නා"[12] (3 පද්‍යය)

ශ්‍රීමත් බ්‍රහ්මයාගෙන් වැඳුම් පිදුම් ලබන සැරියුත් මුගලන් පරපුරෙන් පැවත එන වත් පිළිවෙතින් සරු වූ මහා සංඝරත්නය සැදැහැයෙන් දොහොත් මුදුනෙහි අත් තබා වන්දනා කරමි.

"සිරිමත් බඹ සිරසෙහි පා පිසිනා
සැරියුත් මහ මුගලන් පිළිවෙළිනා"

බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනම සැරියුත් හා මුගලන් යන මහරහතන් වහන්සේලාය. උන් වහන්සේලා ධර්මය දත් අය අතරින් බුදුරදුන් සමීපයෙහි සිටිති.

ධර්ම - විනයෙන් පෝෂිත වූ උන් වහන්සේලාට ශ්‍රේෂ්ඨ බ්‍රහ්මයෝ ද නිතරම වන්දනාමාන කරති. කතුවරයා එම රහතන් වහන්සේලාගේ ගුණ කථනය සිදු කිරීමෙන් මහජනයා තුළ සංඝාලම්භන ප්‍රීතියක් ම ඇති කරවයි.



"පිළිවෙත් සරු මහ සඟ ගණ සොබනා"

සැරියුත් මුගලන් මහරහතන් පරපුරෙන් මහා සංඝරත්නය පැවත එයි. උන්වහන්සේලා ධර්මයෙන් සන්නද්ධය. ඍජු වූ ප්‍රතිපත්ති ඇත්තෝය. වත් පිළිවෙත් දිගින්දිගටම ආරක්ෂා කරගෙන එන්නෝය. නිවන් මගට පිළිපන් මහා සංඝ රත්නයට ද දෙඅත් හිසෙහි තබා ඉමහත් ගෞරවාදරයෙන් වන්දනා කරමි.

පොදුවේ සලකන විට සද්ධම්මෝපායන කතුවරයාට වඩා වැඩි වශයෙන් තෙරුවන් ගුණ තීව්‍ර කර දැක්වීමට ලෝවැඩසඟරා කරුවා භාෂා නෛපුණ්‍යයක් දක්වා ඇති ආකාරය පෙන්නුම් කරයි.

ආනන්ද හිමි සත්වයාට පින්කම් කළ නොහැකි කාල අටක් දක්වයි. එයින් එකක් නම් දරුණු වූ අතිශය භායානක වූ නිරයයි.

"කාරෙන්තො කම්ම කරණං - නිරයෙ අතිදාරුණං
භායානකං භූසං ඝොරං - කථං පුඤ්ඤං කරිස්සති"[13]
(7 ගාථාව)

නිරයෙහි ඉපිද තමා තමාටම ඉතා දරුණු, භයානක, කර්කශ කර්ම නිතර කරවන්නේ කෙසේ පින් කරන්නේද?

අතිශය කෲර වූ ත්, අති බිහිසුණු වූ ත් නිරය පිළිබඳව සිංහලෙන් මෙසේ සඳහන් වෙයි.

"සිතුවත් බිය කරවන අර තර යේ
වැටුණොත් එක්සිය සතිසක් නිර යේ
බලවත් දුක් විඳිනෙය කර දර යේ
මඳකුත් පිනකට නැත අවසර යේ"[14] (9 පද්‍යය)

සිතු පමණින් පවා දැඩි ලෙස භය උපදවන්නා වූ නරක හෙවත් නිරයන් එකසිය තිස් හයක (සත්ත්වයෙකු) වැටුණොත් (ඉපදුණොත්)

බලවත් වූ දුකම විඳීමට සිදු වෙයි. පිනක් කර ගැනීමට අවසරයක් ද ඇත්තේ ම නැත.

පද්‍යයට පූර්ව වූ උක්ත ගාථාවේ නිරය පිළිබඳව සඳහන් වනු විනා එය විස්තර කිරීම අඩුවෙන් සිදු වෙයි. එහෙත් ලෝවැඩසඟරාව පද්‍යයෙන් නිරයන් එකසිය තිස් හයක් ඇති බවත් එම නිරයන් පිළිබඳව සිතීමෙන් පවා භයංකාර බවක් ඇති වෙන බවත් දැඩි කොට පෙන්වා දෙයි. මෙසේ ප්‍රකාශ කර තිබීමෙන් පාඨකයා තුළ පව් නොකළ යුතුය යන හැඟීම පවා උත්සන්න වෙන බව සිතා ගත හැකිය.

සද්ධම්මෝපායනයෙහි තිරිසන් නරකය ගැන මෙසේ සඳහන් කරයි.

"සද්ධම්ම සඤ්ඤාරහිතෙ - සදා උබ්බිග්ගජීවිතෙ
තිරච්ඡානභවෙ සත්තො - කථං පුඤ්ඤං කරිස්සති"[15]
(8 ගාථාව)

සද්ධර්මය පිළිබඳව සඤ්ඤාවක් නැති තැති ගැනීමෙන් පෙළෙන තිරිසන් භවයෙහි සිටින කෙනා කෙසේ පින්කම් කරන්නේද?

මෙම ප්‍රකාශය ම ලෝවැඩසඟරාකරු වන වීදාගම මෛත්‍රීය හිමියන් නරක දෙයින් වැළකීමට පාඨකයාට ඒත්තු යන පරිදි ප්‍රකාශ කරන්නේ මෙසේය.

"තිරිසන් ජාතියෙ උපනත් පව්කොට
අවසත් නොව බිය පවතියි පිටපිට
මඳසත් සුන්කමකුත් නැත හැමවිට
සලසත් නේ කෙලෙසද සිත පිනකට"[16] (10 පද්‍යය)

නොයෙක් ආකාරයේ භායානක පාපකර්ම කිරීම හේතුවෙන් අපාද, ද්විපාද, චතුෂ්පාද, බහුපාද යන තිරිසන් සත්තු අනේක ජාතිවල උපදිති. මෙසේ උපදින තිරිසන් සත්තු අනේක දුක් විඳිමින් අනවතර යෙන් ම බියෙන් පසු වෙති. අනේක විධ භයංකාරත්වය නිසාම කුඩා හෝ සංවරබවක් නො පවත්වති. කරදරයක් වෙතියි යන බිය නිසාම සන්සුන් ඉරියව් නො පවත්වති. ජීවිත බේරා ගැනීම, යන සටනේ යෙදී සිටින මොවුනට කිසියම් පිනක් කර ගැනීමට සිත සන්සුන් බවක්



නොවන ආකාරය අසන්නාට හා පාඨකයාට අදර්ශයක් වෙන ලෙස වීදාගම හිමියෝ හැඟීම් ඇති කරවති.

ප්‍රේත ලෝකයේදී පින් නොකළ හැකි බව සද්ධම්මෝපායනයේ මෙසේ සඳහන් වෙයි.

"ගන්ත්වාන පෙත්තිවිසයං - සන්තාපපරිසොසිතො
ඛුප්පිපාසා පරිස්සන්තො - කථං පුඤ්ඤං කරිස්සති[17]
(9 ගාථාව)

සන්තාපයෙන් තැවෙන සාපිපාසයෙන් පෙළෙන ප්‍රේත ලෝකයෙහි කෙසේ පින් කරන්නේද?
මෙසේ ප්‍රකාශ කොට ඇති පාප ඵල විපාකවල තරම භයානක බව දැඩි ලෙස ලෝවැඩසඟරාකරු දක්වන ආකාරය පහත සඳහන් පද්‍යය අධ්‍ය යනය කිරීමෙන් පෙනෙයි.

"උපනත් පේතව පව් කොට නොපණ ත්
කලෙකත් නො ලැබෙයි සෙම් සොටු පමණ ත්
උගුරත් නොතෙමෙයි සුරගඟ වැටුන ත්
කලෙකත් පින් නොකළැකි මැයි සිතුන ත්"[18]
(11 පද්‍යය)

මිනිසා බුද්ධ නීතියට විරුද්ධ වූ පාපකර්ම සිදු කොට විරූප වූ ප්‍රේතාත්ම භාවවල උපදියි. සාපිපාසාදියෙන් මිරිකුණේ එම ප්‍රේතයෝ ආහාරපාන සොයා ගව් ගණන් ඇවිදිති. අනෙක් මිනිසුන් විසින් අතිශය පිළිකුල් කොට ඉවත ලන සෙම් සොටු ටිකක් වත් ඔවුන්ගේ පොරකෑම නිසා නො ලැබෙයි. ඔවුන්ගේ පව්කාරකමෙහි ඇති බරපතළකම කෙසේද කියතහොත් අනෝතත්ත විලෙන් ආරම්භ වී හැට යොදුනක් අහසින් ගොස් තියග්ගලා නම් පර්වත මුදුනෙන් ගමන් කරන ආකාශ ගංගාව හෙවත් සුරගඟ ප්‍රේතයන්ගේ උගුර හරහා ගමන් කළත් උගුර නො තෙමෙන්නේය. ප්‍රේත ලෝකයේ ඉපිද සාපිපාසාවෙන් පරිපීඩිත වූයේ පිනක් පිළිබඳව කෙසේ නම් යොමු වෙන්නද?

සද්ධම්මෝපායන කර්තෘගේ ප්‍රකාශය දැඩි ලෙස පාඨක ශ්‍රාවක සිත් සතන් කම්පා කරවන පරිදි පවකට නො නැමෙන ලෙසින් ලෝවැඩසඟරා කර්තෘවරයා පද්‍යයෙන් දක්වා ඇති ආකාරය විචේචකය න්ගේ පවා චිත්තාරාධනය කරන්නේමය.

මෙලෙච්හි මිනිසත් බව ලැබීම අතිශයින් දුර්ලභ වූ අවස්ථාවක් ලෙසින් සද්ධම්මෝපායනයේ මෙසේ සඳහන් වෙයි.

"එක පුග්ගල සුත්තෙන - කාණකච්ඡෝප මෙන ච
උභින්නං දුල්ලභත්තං හි - වෙදිතබ්බං විජානතා"[19]
(44 ගාථාව)

ඒක පුද්ගල සූත්‍රයෙන් ද කණ කැස්බෑවාගේ උපමාවෙන්ද (බුද්ධෝත්පාදය, මනුෂ්‍යත්වය) දෙදෙනාගේ දුර්ලභබව නුවණැත්තා විසින් දත යුතුය.

සද්ධම්මෝපායනයේ සඳහන් මෙම ගාථාවට අනුව විශේෂයෙන් කණකැස්බෑ උපමාවෙන් මිනිසත් බවක් ලැබීමේ දුර්ලභ බව කෙටියෙන් සඳහන් කරනු හැර විස්තරයක් ඉදිරිපත් නො කරයි.

එහෙත් ලෝවැඩසඟරාවේ එම අදහස මිනිස් හදවතට දැනෙන පරිදි තීව්‍ර කර මිනිස් දිවියේ වටිනාකම පහත දැක්වෙන කවියෙන් මවා පෙන්වයි.

දිගු පුළුලි න් සක්වල වන් සිඳු කුස
සියවසකි න් උඩ එන කැස්බෑ හිස
වියසිදුරෙ න් නැගෙතත් දුගතිය බැස
තව උපදි න් නට බැරි මෙමිනිස් කුස"[20] (18 පද්‍යය)

ඉතා දීර්ඝ වූ හා ඉතා පළල් වූ සක්වළ හා සමාන වූ මහා මුහුදෙහි අවුරුදු සියයකට පමණ එක් වරක් උඩට එන්නා වූ කණ කැස්බෑවෙකුගේ හිස (මූදේ එහා මෙහා පාවෙන්නා වූ) විය ගහක තිබෙන සිදුරකින් කිසියම් විදියකින් (උඩට) මතු වෙතත්, දුගතියෙහි



(අපායෙහි) උපන්නෙකු මෙම මිනිස් ලෝකයෙහි ඉපදීම ඊටත් වඩා දුෂ්කර වෙයි.

දස අකුසල පථ ආදීනව ගාථා (දස අකුසල්හි දොස්) දැක්වීමේදී සද්ධම්මෝපායන ගත්හි ප්‍රාණඝාතයක් සිදුවීමට බලපාන අංග ගෙන හැර දක්වයි. ඒ බව ගාථා තුනකින් දක්වා ඇත්තේ මෙ පරිද්දෙන්ය.

"සත්තෙ සත්තොති සඤ්ඤා ච - වධකචිත්තමුපක්කමො
තෙන ජීවිත නා සො ච - සහත්ථා චතුරංගිකො"
"යථාදිප්පාය ආනත්ති - තථාතං සම්පටිච්ඡනං
පටිඤ්ඤං අවිනාසෙත්වා - තථාව කරණම්පිච"
"පයොගං ඡෙවිධාවුත්තෙසු - ඡඩ්ඩෙත්වා සහ තෙ හි ච
ඡළංගාණත්තියා හොති - පාණහිංසාති දීපයෙ"[21]
(58-59-60 ගාථා)

සතෙකු වීම, සතෙකි යයි දැනීම, මරමියි සිතීම' උපක්‍රමය, එයින් ජීවිතය නැසීම යයි සහත්ථික ප්‍රාණඝාතයේ අංග සතරකි.

අභිප්‍රාය අනුව අණ කිරීම, එය පිළිගැනීම,
ප්‍රතිඥාව අනුව සිදු කිරීම යන අංග තුන හා

ඉහතින් කියන ලද අංග සතරෙහි ප්‍රයෝගය හැර ඉතිරි අංග තුන හා එක්ව ඇණවීමෙන් සිදුවන ප්‍රාණඝාතයේ අංග සයකි.

එහෙත් ලෝවැඩ සඟරාවේ කවර හෝ උපක්‍රමයකින් ප්‍රාණයක් ඝාතනය කළහොත් එම තැනැත්තාට සිදු වන ඉරණම කුමක්දැයි ඉතා දැඩි ලෙස මෙසේ ගෙන හැර දක්වයි. අවසානයේ සෑම කෙනෙක්ම භයංකර මාරයාට ගොදුරු වෙන ආකාරයද පෙන්වා දෙයි.

"බුදු බණ අසමින් සිත සතපා යේ
කුරුපණ කම් ඇරපිය ඒ පා යේ
පරපණ නැසුවොත් කවර උපා යේ
අපමණ දුක් දෙයි සතර අපා යේ"



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015

"මැඩියන් නයි මුව ගොදුරුව ඉඳ යා
පණුවන් කනමෙන් රසවිඳ විඳ යා
සැලෙමින් ජරගොර මරුමුව වැද යා
බලමුන් පරපණ වනසන ලෙද යා"[22] (77-78 පද්‍ය)

කල්ප කීපයක් මුළුල්ලේ පවා ඇසීමට දුර්ලභ වූ මෙත් කරුණා උගන්වන උත්තම බුදුරජාණන් වහන්සේගේ බුදුබණ හොඳින් අසා සිත සතුටු කර ගන්න. එපා කරන ප්‍රාණඝාතාදී ක්‍රියා අත හරින්න. කුමන හෝ උපක්‍රමයකින් අනුන්ගේ වටිනා ප්‍රාණය විනාශ කළහොත් චතුර්විධ අපායෙහි අප්‍රමාණ දුක් විඳීමට සිදු වෙයි. (නරකය, ප්‍රේතය, තිරිසන්ය, අසුරය, යන සතර අපායේ දුක් විඳියි.)

මැඩියෝ ඔවුන්ව ආහාරයට ගොදුරු කර ගැනීමට බලා සිටින නාගයන්ගේ මුඛය ආසන්නයේ සිටියදීත් ම ඒ පිළිබඳව හැඟීමක් ආශාවක් ඇති නොකොට ගෙන මැඩියන්ගේ ඉතා රසවත් ආහාරයක් වූ පණුවන් කති. ශරීරාංගයන් ජරාවෙන් පීඩිතිව මාරයාගේ මුඛ්‍යට ආසන්නව සිටියදීත් ඒ පිළිබඳව නොසිතා (පරලොවදී සිදුවන විපත දුක ආදිය කල්පනා නොකොට) මිනිසුන් අන්‍යයන්ගේ ප්‍රාණය ඝාතනය කරන ආකාරය බලන්න.

සද්ධම්මෝපායනයේ දස අකුසල ආදීනව ගාථා හෙවත් දස අකුසල්හි දොස් දක්වන කොටසේ ප්‍රාණඝාත කර්මයෙහි විපාක මෙසේ දක්වා ඇත.

"හිංසා අප්පායුකත්තඤ්ච - බහ්වාබාධත්තනම්පිච
වියෝග දුක්ඛ බාහුල්‍යං - ජනෙතුබ්බිග්ගවාසතං"[23]
(77 ගාථාව)

ප්‍රාණඝාත කර්මය කිරීම හේතුවෙන් ආයුෂය මද බවද, බොහෝ රෝග ඇති බව ද, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක් බහුල බව ද, බියපත්ව විසීම ද ඇති කෙරෙයි.

ලෝවැඩ සඟරාවේ දස අකුසල් පල නිදසුන් පෙන්වන පැදි පෙළේ ප්‍රාණඝාතය හේතුවෙන් පුද්ගලයෙකුට ආත්මභාව ගණනාවක්



ගත වෙන තෙක්ම මුහුණ පෑමට සිදුවන අතිශය භයානක අකුසල විපාකය පාඨක, ශ්‍රාවක හද කම්පා කරවන සුලුය. පවෙහි විපාක වල තරම පිළිබඳව මනා පාඩමක් ද උගන්වයි. වරක් මෙම සිංහල පද්‍යය ඇසුවහොත් තමන්ගේ පණ හා සමානව අන්‍යයන්ගේ පණෙහි ඇති බරපතළකම ද වටහා ගැනීමට පෙලඹෙයි.

ස්ත්‍රියක් එළු දෙනෙකගෙ බෙල්ල කැපූ වේදනාවේ වන්දි ගෙවීමට ආත්ම වාර ගණනාවක්ම අනන්ත කෲර දුක් වේදනා වින්ද ආකාරය පද්‍යයකින් පාඨකයා සහ අසන්නා වෙත කියාපායි.

"පෙර අඟනක් එක් එළු දෙනක ඉස සිඳා
සියලඟ වැළඳි ගිනිදැල් නිරය දුක් විඳා
ඇය ඇඟ ලෝම ගණනේ ඉස් කැපුම් ලදා
මෙම රඟ වේය කාටත් අකුසලේ ලෙදා"[24] (95 පද්‍යය)

පූර්ව ආත්මයක කාන්තාවක් එක්තරා එළු දෙනෙකගේ බෙල්ල කැපූ පාපයෙන් නරකයෙහි ඉපිද මුළු ශරීරය ගිනිදැල්වලින් වෙළී බලවත් දුකක් වින්දත් ඇය කළ පාපකර්මය ගෙවී නො ගියේය. පසුව ඒ ඒ ආත්මභාවයන්හි එළුදෙනගේ ශරීරයේ තිබූ ලොම් ගණනට කාන්තාව ද හිස කැපුම් ලැබුවාය. අකුසලේ විපාකය (ගතිය) කොයි කාට වුවත් මේ ආකාරයට ම සිද්ධ වන්නේය.

උක්ත කාරණය සම්බන්ධයෙන් සද්ධම්මෝපායනයේ විපාක වශයෙන් දක්වා ඇති ප්‍රතිඵල හතරම වෙනුවට දුක් විඳීම පමණක් කියවෙන සිංහල පද්‍යය කිසියම් තීව්‍ර බවක් ප්‍රකාශ නො කරන්නේද?

කේලාම් කීම වනාහි ලෝකයේ මිනිසුන් ක්ෂණිකවම විනාශ යට පත්කළ හැකි භයානකවූ විෂ දෙයකි. කේලාම් කීමේ විපාක නිසා මෙලොවදීම ඔහුට මිතුරන් පවා අහිමි වෙන බව සද්ධම්මෝපායනය කතුවරයා ප්‍රකාශ කරන්නේ පහත දැක්වෙන පරිදිය.

"සුසම්බද්ධාපි කස්සීධ - මිත්තා භිජ්ජන්ත්‍ය කාරණා
පියසුඤ්ඤකරං යොහි - පෙසුඤ්ඤමකරී පුරා"[25] (81 ගාථාව)

පෙර කේලාම් කියා ප්‍රියයන් බිඳවූයේ නම්, මේ ජාතියේ සබැඳි ඔහුගේ මිතුරෝ නිකරුණේ තරහ වෙති.

ලෝවැඩසඟරා කර්තෘ හිමියෝ කේලාම් කියා අනුන් භේද කරවීමේ පල විපාක පාඨකයාට හා අසන්නාට කේලාම් කීම එපාකර වන ආකාරයට සද්ධම්මෝපායන කියමනටත් වඩා ඉතා දැඩි කොට විස්තරව දක්වා ඇත්තේ මෙසේය.

"පිසුණු කියා සඟ දෙනමක් වෙනස් කොට
පැසුණු එකෙක් නිරයේ කල්පයක් සිට
මුහුණු කුණුව තව පේතව විඳි ගැහැට
පිසුණු බසක් නො කියව් අද පටන් සිට[26] (99 පද්‍යය)

එක් පුද්ගලයෙක් (භික්ෂුවක්) කේලාම් වචන කියා ඉතා මිත්‍රව සිටි තවත් භික්ෂූන් වහන්සේලා දෙනමක් භේද භින්න කළේය. එහි ප්‍රතිඵල වශයෙන් කල්පයක් පමණ කාලයක් අතිභයංකර නිරයෙහි ඉපිද කෲර වූ දුක් වේදනා වින්දේය. නැවතත් ඔහු එයින් මිදී ප්‍රේත යෙක්ව උපන්නේය. නිතරම මුහුණ අනුන් අප්‍රිය කරන ආකාරයට කුණු වී පැවතුණේය. අපමණ දුක් පීඩාද වින්දේය. ඒ නිසා පින්වත ! ඔබද අද සිටම අතිශය නරක විපාක ලැබෙන තවකෙකුට විරුද්ධව කේලාම් වචනයක්වත් නො කියන්න.

සද්ධම්මෝපයනයෙහි කේලාම් කීමේ විපාක පිළිබඳව දැක්වෙන ගාථාර්ථයට වඩා ලෝවැඩසඟරාවේ කේලාම් විපාක කියවෙන පද්‍යයේ අර්ථය කෙතරම් නම් මිනිසාට සමීප ද? කේලාම් නො කීමට සිත නම්‍යශීලි නො වන්නේද?

මෛත්‍රිය කිරීම මුළු ලෝකයටම අත්‍යවශ්‍ය දෙයකි. ලෝවැස්සා අතර සහජීවනය පැවැත්මට බහුල වශයෙන් හේතු වන්නේ මෛත්‍රියයි. මෙත් වැඩීම නිසා සත්ත්වයා මෙලොව පමණක් නොව ඊළඟ ආත්ම භාවලදී පවා සැප විපාක ලබති. වර්ෂ හතක් මෛත්‍රී භාවනාව වැඩූ



උතුමෙකුට ලැබුණු ප්‍රතිඵලය පිළිබඳව ආනන්ද හිමියෝ මෙසේ සඳහන් කරති.

"සුනෙත්තො සත්තවස්සානි - භාවෙත්වා මෙත්ත මුත්තමං
සත්ත සංවට්ට කප්පෙසු - නෙමං ලොකං පුනාගාමි"[27]
(484 ගාථාව)

සුනෙත්‍ර තාපසතුමා උතුම් මෛත්‍රී භාවනාව සත්වසක් වඩා සංවර්ත කල්ප හතක් නැවත මේ ලෝකයට නො ආයේය.

මෛත්‍රියට විරුද්ධ වචනය වන්නේ වෛරයයි. මිනිස්සු වෛර කරගනිති. එහි ප්‍රතිඵලය වශයෙන් මෙම ආත්මභාවයේ හෝ පරලොව දී අනිටු විපාක ලබති. මිනිසුන් අතර සහයෝගී බව, එකමුතුකම රඳාපව තින්නේ මෛත්‍රිය කරණ කොට ගෙනමය. විදාගම මෛත්‍රිය හිමියෝ වෛර කරන පුද්ගලයන්ට දොස් පවරමින් මෛත්‍රිය පුහුණු කරන්නන්ට ලැබෙන ආනිශංස මෙසේ ගෙනහැර දක්වති.

"යහපත නොසිතන සැටි මේ දන යා
කිපිසත උනුනට දෙති වේ දන යා
හැම සත වෙත කළ මෙත් බාවන යා
සැක නැත සගමොක් සැප සාදන යා"[28] (112 පද්‍යය)

මේ ලෝකයේ ජනයා ඔවුනොවුන්ගේ ප්‍රයෝජන සඳහා යහපතක් නො සිතන ආකාරය බලන්න. කෝප වෙමින් වෛර කර ගැනීමෙන් ඔවුනොවුන්හට දුක් වේදනා පීඩා කරගන්නා අයුරුද බලන්න වෛරය අතහැර මෛත්‍රී භාවනාව කරමින් මෛත්‍රී සහගතව ඔවුනොවුන් දෙස බලා යහපත වෙනුවෙන් ම ක්‍රියා කරත්නම් මෙලොව පරලොව දෙව්ලොවම සැප ආනිශංසම ලබති.

මෛත්‍රී හිමියෝ අඬදබර කර ගැනීමේ ඇති ආදීනවත් සත්ත්ව ප්‍රජාව කෙරෙහි මෛත්‍රීය පැතිරවීමේ ආනිශංස බල බලමහිමයෙන් අනිවාර්යයෙන්ම ස්වර්ග මෝක්ෂ සැප සම්පත ලබන බවත් සද්ධම්



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015

මෝපායන කර්තෘට වඩා ජන හදවතට කා වදින ලෙස ඉහත සඳහන් පද්‍යයෙන් ද කියාපාති.

ග්‍රන්ථද්වය ම වෙන් වෙන්ව සලකා බලතහොත් සද්ධම්මෝපායනයේ සෑම ගාථාවකින් ම දක්නට ලැබෙන්නේ කරුණු ගැනහැර පෑමේ සඞ්ක්‍ෂිප්ත බවය. තීව්‍ර බවින් හෙවත් දැඩි බවින් ඌන බැව්ය. එහෙත් ලෝවැඩ සඟරාවෙන් පාඨකයාට හා අසන්නාට පරලෝවදී හෝ මොලොවදී ලැබෙන පල විපාකවල ස්වරූපය දැඩි ලෙසම ප්‍රකාශ කරන බව පෙන්නුම් කරයි.

මෙසේ ඒ ඒ අංශවලින් ලෝවැඩසඟරාව රචනා කිරීමේ දී සද්ධම්මෝපායන කතුවරයාගේ අදහස් වඩාත් තීව්‍ර කරමින් සිංහල පද්‍ය මගින් සවිස්තරව ජනහදවත් තුළ කිඳා බැස්සවීමට වීදාගම හිමියන් දැක් වූ ප්‍රයත්නය සැබැවින්ම සිංහල පාඨක ශ්‍රාවක දෙපාර්ශ්වයේම ප්‍රශංසාව හිමි විය යුත්තකි.

## ආන්තික සටහන්


[1] හෙට්ටිආරච්චි, ඩී.ඊ. **සිංහල විශ්ව කෝෂය**, දෙවන මුද්‍රණය (අයිසෝ - ආහාර දක්වා) කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුව, 1998, පිටුව 509.

[2] සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, **සිංහල සාහිත්‍යවංශය**, දෙවන මුද්‍රණය, කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය, 1964, පිටුව 138.

[3] **සද්ධම්මෝපායනය**, සංස්: පල්ලේගම සමිත හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999, පිටුව 80.

[4] මලලසේකර ගුණපාල, **ලංකා පාලි සාහිත්‍යය**, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1965, පිටු 157 - 158.

[5] **සද්ම්මෝපායනය**, 1999, පිටු 63 - 78.

[6] ලෝවැඩසඟරා වර්ණනාව, 5 වන මුද්‍රණය සංස්: කුළුපන ධර්මරත්න, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2012, පිටු 390 - 391.

[7] **සිංහල සාහිත්‍ය වංශය**, 1964, පිටු 259-260.

[8] **සද්ධම්මෝපායනය**, 1999, පිටුව 74.





[9] **සද්ම්මෝපායනය**, සංස්: මීගොඩ කල්‍යාණතිස්ස හිමි, කැලණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය, 1997, පිටු 32 - 33.

[10] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2012, පිටු 24 - 34.

[11] **එම**, පිටු 34 - 37.

[12] **එම** , පිටු 37 - 40.

[13] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 32 - 33.

[14] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 71 - 74.

[15] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 32-33.

[16] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 74 - 76.

[17] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 32 - 33.

[18] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 76 - 80.

[19] **සද්ධම්මෝපායනය,** 1997, පිටු 38 - 39.

[20] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 94 - 96.

[21] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 42 - 43.

[22] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 226 - 229.

[23] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 44 - 45.

[24] **ලෝවැඩසඟරා වර්ණනාව**, පිටු 271 - 273.

[25] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 46 - 47.

[26] **ලෝවැඩසඟරා වර්ණනාව**, 2013, පිටු 282 - 283.

[27] **සද්ධම්මෝපායනය**, 1997, පිටු 114 - 115.

[28] **ලෝවැඩසඟරා වර්ණනාව**, පිටු 314 - 318.